පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 07 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- පුරවැසි අධ්‍යාපනය I , II

පාසලේ නම : ..............................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැය 2යි

## 1 කොටස

**සැළකිය යුතුයි**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

---

- **අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අදින්න.**

01. සාමාජිකයින් අතර බැදීම් ඉතාම ශක්තිමත්ම සමාජ ඒකකය වන්නේ,

  1. පන්තිය  2. පාසල  3. පවුල  4. කාර්යාලය

02. අම්මා, තාත්තා සහ දරුවන්ගෙන් පමණක් සැදුම්ලත් පවුල හඳුන්වන්නේ,

  1. න්‍යෂ්ටික පවුල ලෙසිනි.  2. කුඩා පවුල ලෙසිනි.
  3. විස්තෘත පවුල ලෙසිනි.  4. හොඳම පවුල ලෙසිනි.

03. කිසියම් විෂය ක්ෂේත්‍රයක් හා සම්බන්ධව තොරතුරු ඉදිරිපත් කරන මූලාශ්‍ර හඳුන්වන්නේ,

  1. තොරතුරු ලෙසය.  2. දත්ත ලෙසය.
  3. විස්තර ලෙසය.  4. කරුණු ලෙසය.

04. "ශ්‍රී ලංකා මාතා" යන ජාතික ගීයේ නිර්මාතෘවරයා වන්නේ,

  1. ජේ.ආර්. ජයවර්ධන මහතාය.  2.ඩී.එස්. සේනානායක මහතාය.
  3. සාගර පලන්සූරිය මහතාය.  4. ආනන්ද සමරකෝන් මහතාය.

05. අයහපත් චිත්තවේග තත්ත්වයන් පාලනය කිරීමෙන්,

  1. ජීවිත හානි වැළකේ.  2. දේපළ හානි සිදුවේ.
  3. හොඳ හිත පළුදු වේ.  4. ධනය විනාශවේ.

- අංක 06-10 දක්වා ප්‍රශ්න වලට වඩාත් ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

( ඉවසීම/ නීතිගරුක බව/ මාධ්‍ය බලපෑම/ යුතුකම්/ අයිතිවාසිකම්/ ජය ගැනීම/)

06. ශිෂ්‍යයෙකු ලෙස අධ්‍යාපනය ලැබීම ------------------------------------ කි.

07. ශිෂ්‍යයෙකු ලෙස හොඳින් ඉගෙන ගැනීම ---------------------------------------------- කි.

08. --------------------------------------- යහපත් පුරවැසියෙකු සතු විය යුතු ගුණාංගයකි.

09. -------------------------------------- වර්තමාන සමාජයේ බොහෝ පිරිස් මුහුණ පාන අභියෝගාත්මක අවස්ථාවකි.

10. අභියෝගවලට සාර්ථකව මුහුණ දීම සඳහා, ------------------------------- වර්ධනය කරගත යුතුය.

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල "අ" තීරුවේ ප්‍රකාශයන්ට ගැළපෙන පිළිතුර " ආ " තීරුවෙන් තෝරා යා කරන්න.

| අ - තීරුව | ආ - තීරුව |
|---|---|
| 11. සංස්කෘතික අංගයකි | සෞභාග්‍ය |
| 12. සිවිල් අයිතිවාසිකමකි | ආගම |
| 13. අසල්වාසීන් සමඟ සුහදව කටයුතු කරන අවස්ථාවකි | කැමති ආගමක් ඇදහීම |
| 14. රාජ්‍ය ලාංඡනයේ වී කරල්වලින් අර්ථවත් වන්නේ | පරිපූර්ණ බව |
| 15. රාජ්‍ය ලාංඡනයේ පුන් කලසෙන් අර්ථවත් වන්නේ | ශ්‍රමදාන |

- අංක 16 සිට 20 දක්වා දී ඇති ප්‍රකාශ නිවැරදි නම් ✔ ලකුණ ද වැරදි නම් x ලකුණ ද දීරියේ ඇති වරහන තුළ යොදන්න

16. රාජකාරී නිසි ලෙස ඉටුකිරීම සදාචාරාත්මක යුතුකමකි ( )
17. අප රටේ ජාතික ක්‍රීඩාව අත් පන්දු වේ. ( )
18. සෑම උත්සවයකදීම ජාතික කොඩියට ප්‍රමුඛස්ථානයක් දිය යුතුය. ( )
19. ශ්‍රී ලාංකික ජන සමාජය බහු සංස්කෘතික සමාජයක් නොවේ. ( )
20. පවුලේ සාමාජිකයින් එක්ව ආහාර ගැනීම හොඳ සම්ප්‍රදායකි. ( )

(ලකුණු 2x20=40)

**

## පුරවැසි අධ්‍යාපනය - 11

- ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

01.

i. පුද්ගලයෙකුගේ අනන්‍යතාව දැක්වෙන සවිශේෂ වෙනස්කම් 3 ක් ලියන්න. ( ලකුණු 3)

ii. ඔබේ ජීවිතය සාර්ථක කරගැනීමට අවශ්‍ය හිතකර බලවේග 4 ක් ලියන්න. ( ලකුණු 4)

iii. පවුලේ සාමාජිකයෙකු ලෙස වර්ධනය කරගතයුතු යහපත් ගුණාංග 5 ක් ලියන්න. ( ලකුණු 5)

02.

i. අයහපත් චිත්තවේග පාලනය කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාකාරකම් 3 ක් ලියන්න ( ලකුණු 3)

ii. ඇසුරුම් සහිත නිෂ්පාදන මිලදී ගැනීමේදී අවධානය යොමුකළ යුතු කරුණු 4 ක් ලියන්න. ( ලකුණු 4)

iii. යහපත් පුරවැසියෙකු සතුවිය යුතු ගුණාංග 5 ක් ලියන්න. ( ලකුණු 5)

03.

i. පවුලෙන් ඔබට ලැබෙන අයිතිවාසිකම් වලට නිදසුන් 3 ක් ලියන්න. ( ලකුණු 3)

ii. ඔබ ජීවත්වන සමාජයේ මිනිසුන් අන්තර් සම්බන්ධතා පවත්වන සමිති සමාගම් 4 ක් ලියන්න. (ලකුණු4)

iii. ආමික සංවිධාන මගින් සමාජයට සිදුවන සේවාවන් 5 ක් ලියන්න. (ලකුණු5 )

04.

I. ජනමාධ්‍ය මගින් ඉදිරිපත් කරන, අපට වැදගත් වන්නවූ තොරතුරු වර්ග 3 ක් ලියන්න. ( ලකුණු 3)

II. ප්‍රජාතන්ත්‍රවාදී රටක පුද්ගලයින්ට හිමි දේශපාලන අයිතිවාසිකම් 4 ක් ලියන්න. ( ලකුණු 4)

III. සිවිල් අයිතිවාසිකම් 3 ක් ලියා ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. ( ලකුණු 5)

05.

I. සංස්කෘතිය යන්න හඳුන්වන්න. ( ලකුණු 3)

II. සෑම සංස්කෘතියකම දක්නට ලැබෙන පොදු අංග ලක්ෂණ 4 ක් ලියන්න (ලකුණු 4)

III. සංස්කෘතික අංග 5 ක් ලියන්න. (ලකුණු 5)

06.

I. මෙරට සෑම ආගමකටම අයත් පූජනීය ස්ථාන බවට පත්වී ඇති ස්ථාන 3 ක් ලියන්න. (ලකුණු 3)

II. ශ්‍රී ලංකා ජන සමාජයේ දක්නට ලැබෙන ජන වර්ග 4 ක් ලියන්න. (ලකුණු 4)

III. සංස්කෘතික දායාද ආරක්ෂා කරගැනීමේ පුරවැසි යුතුකම් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු5)

07.

I. ජාතික අනන්‍යතාව පිළිබිඹු කරන සංකේත 3 ක් ලියන්න. (ලකුණු 3)

II. ජාතික ගීය ගායනා කරනු ලබන අවස්ථා 4 ක් ලියන්න. (ලකුණු 4)

III. සාරධර්ම ඉස්මතු කරන පද්‍ය කෘති 5 ක් ලියන්න. (ලකුණු 5)

***

# උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පුරවැසි අධ්‍යාපනය 2023- තුන්වන වාරය පිළිතරු පත්‍රය

### 1- පත්‍රය

1) -3 2) -1 3) -2 4) -4 5) -1

6) - අයිතිවාසිකමකි 7)- යුතුකමකි 8) නීතිගරුක බව 9) මාධ්‍ය බලපෑම
10) ඉවසීම

11 ආගම 12 කැමති ආගමක් ඇදහීම 13 ශ්‍රමදාන 14 සෞභාග්‍ය
15 පරිපූර්ණ බව

16 - x 17 - ✓ 18 - ✓ 19 - x 20 - ✓

### 11 පත්‍රය

01.) 1- බාහිර පෙනුම/ අත්ලේ රේඛා/ඇඟිලි

2- පවුල/ පාසල/ ආගමික ස්ථාන/මිත්‍රයන්/හොඳ පොත්/හොඳ මාධ්‍ය වැඩසටහන්

3- යහපත් දේපිළිගැනීම හා අයහපත් දේ පිළිනොගැනීම/ සුහදශීලී බව/අවංක බව/ ස්වයං විනය/ අන්‍ය මතවලට ගරු කරීම/ පවුලේ දියුණුවට කැපවීම/ නායකත්වයට ගරු කිරීම

02.) 1- ආගමික කටයුතුවල නිරතවීම/ ඇවිදීම/ කවි ගීත ගායනය/ චිත්‍ර අඳීම/ පොත් කියවීම/ ක්‍රීඩා කිරීම/ ගුවන් විදුලි රූපවාහිණී වැඩසටහන් නැරඹීම ආදී---

2- නිෂ්පදිත දිනය/ කල් ඉකුත්වන දිනය/ උපරිම සිල්ලර මිල/ ශුද්ධ බර/ අඩංගු ද්‍රව්‍ය

3- ස්වයං විනයෙන් කටයුතු කිරීම/ නායකත්වයට ගරු කිරීම/ පොදු දේපළ ආරක්ෂා කිරීම/ සයොගයෙන් කටයුතු කිරීම/ නායකත්වය දැරීම/ අවංක බව/ ඉවසීම/ අන්මතවලට ගරු කිරීම/ නිහතමානී බව/ පරාර්ථකාමී බව/ සරළ දිවිපැවැත්ම ආදී----

03.) 1- ආහාර හා පෝෂණය/ සෞඛ්‍ය පහසුකම්/ ඇඳුම් පැළඳුම්/ නිවාස පහසුකම්/ දෙමාපිය ආදරය දයාව/ ආරක්ෂාව/අධ්‍යාපනය - ලැබීම

2- ආගමික සංවිධාන/ මරණාධාර සමිති/ ක්‍රීඩා සමිති/ යෞවන සමාජ/ මහිලා සමිති/ වෘත්තීය සමිති ආදී--

3- ආගම ඉගෙනීමට/ ආධ්‍යාත්මක සංවර්ධනයට/ සාරධර්ම හුරු කිරීමට/ ආගමික වතාවත්වලට/ පොදු කටයුතුවලට/ සමාජය විනයවත් කිරීමට

04.) 1- කාලගුණ අනාවැකි/ විනිමය අනුපාත/ වැදුත් දුරකථන අංක/ රාජ්‍ය නිවේදන/ රැකියා තොරතුරු/වෙළඳදැන්වීම්

2- ඡන්දය ප්‍රකාශ කිරීම/ ඡන්දය ලබා ගැනීම/ දේශපාලන පක්ෂයකට බැදීම/ කැමති ආණ්ඩුවක් පත්කර ගැනීම/ ආණ්ඩුව විවේචනය කිරීම/ රජයේ තනතුරු දැරීම

3- ජීවත්වීමෙ අයිතිය/ අධ්‍යාපනය ලබීම/ කැමති ආගමක් ඇදහීම/ අදහස් ප්‍රකාශ කිරීම/ රැකියාවක් කිරීම/ සමානාත්මතාවය/ කැමති තැනක ජීවම

05.) 1- සංස්කෘතිය යන්න දළවශයෙන් හදුන්වා ඇත්නම් ලකුණු පිරිනමන්න

2- අධ්‍යාපනය /සිරිත් විරිත්/ ආහාර පාන/ වැඩිහිටියන්ට සැලකීම/ සංස්කෘතිය පවරාදීම/ බත් එළවලු පළතුරු

3- ආගම/ දැනුම/ කලා ශිල්ප/ භාෂාව/ සාහිත්‍ය/ ආහාර පාන/ ඇදුම් පැළදුම්සිරිත් විරිත්/ අධ්‍යාපනය/ විශ්වාස හා ඇදහිළි/ නීති හා සම්ප්‍රදායන්

06.) 1- කතරගම දේවාලය/ නල්ලූර් කෝවිල/ මඩු පල්ලිය/ තලවිල ශාන්ත ආනා දෙව් මැදුර/ ශ්‍රී පාදස්ථානය

2- සිංහල/ දෙමළ/ මුස්ලිම්/ මැලේ/ බර්ගර්

3- අදාළ පරිදි ලකුණු පිරිනමන්න.

07.) 1- ජාතික කොඩිය/ ජාතික ගීය/ ජාතික පුෂ්පය/ ජාතික පක්ෂියා/ ජාතික ක්‍රීඩාව/රාජ්‍ය ලාංඡනය

2- ජාතික උත්සව/ රාජ්‍ය උත්සව/ ශ්‍රී ලංකාවේ රාජ්‍ය නායක උත්සව/ පාසල් හා පොදු වැදගත් උත්සව/ ශ්‍රී ලංකාව නියෝජනය කරන ජාත්‍යන්තර තරග/ වෙනත් වැදගත් උත්සව

3- සිරිත් මල්දම/ ලෝවැඩ සඟරාව/ ලෝකෝපකාරය/ සුභාෂිතය/ ප්‍රත්‍යශතකය/ හිතෝපදේශය/ ව්‍යාසකාරය

LOL.lk
**BookStore**

# විභාග ඉලක්ක
# පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book | ගුරු අත්පොත්

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**